Australian Red Cross

# ඔස්ට්‍රේලියාව තුළ නූතන වහල් සේවය සිදුවෙයි



සේවා ස්ථානයේ දී බරපතල ලෙස සූරාකෑම ඔස්ට්‍රේලියාව තුළ අපරාධයක් වේ. ඔබ හෝ දන්නා කෙනෙක් සූරා කෑමට ලක්වන්නේ නම්, උදව් තිබේ.

ඔස්ට්‍රේලියාවෙ සියලු සේවකයන්ට මූලික අයිතීන් ඇති අතර ඔවුන් නීතිය මගින්  ආරක්ෂා කොට ඇත. මෙම නීති මගින්, විදේශයන් සිට පැමිණ සිටින සේවකයන් ද ඔවුන් මෙහි සිටින කාලය හෝ වීසා කාණ්ඩය නොසළකමින් ආවරණය කරනු ලබයි.

## සේවා ස්ථානයේ දී ඔබට සාධාරණව සැලකිය යුතුය



## ඔබේ අයිතිවාසිකම් දැන සිටින්න

සංක්‍රමණික සේවකයන්ට හා වීසා දරන්නන්ට ද ඔස්ට්‍රේලියාවෙ සෙසු සේවකයන්ට හා සමාන සේවා ස්ථානයේ අයිතිවාසිකම් තිබේ.

Fair Work ඔම්බුඩ්ස්මන්වරයා විසින් නොමිලේ සේවය ලබා දෙන අතර එමගින් ඔස්ෙට්‍රේලියාවෙ සේවය කරන අතර ඔබට ඇත අයිතිවාසිකම් ගැන අවබෝධයක් ලබාගත හැකි වනු ඇත. මෙයට පහත කරුණු ඇතුළත් වේ:

- අවම වැටුප් අනුපාතය
- සේවා ස්ථානයේ සෙසු අවම තත්ත්වයන්, නිවාඩු හෝ විවේක ඇතුළත්ව
- සේවා ස්ථානයේ ආරක්ෂාව, අසාධාරණයට ලක්වීමෙන් තොරව සිටීමට ඇති අයිතිය ඇතුළත්ව

සියලු සේවායෝජකයන් මෙම නීති පිළිපැදිය යුතුයි. සේවකයකු එකඟ වී ඇති අවස්ථාවක පවා, නීතියෙන් දක්වා ඇති අවම ගාස්තුවට අඩුවෙන් ගෙවීමට ඔවුන්ට නොහැක.

සේවා ස්ථානයේ ඔබේ අයිතිවාසිකම් දැනගැනීමට www.fairwork.gov.au වෙත යන්න. නැත්නම් 13 13 94 ඔස්සේ ඔම්බුඩ්ස්මන් අමතන්න. භාෂණ පරිවර්තකයකු අවශ්‍ය නම් 13 14 50 ඔස්සේ පරිවර්තන හා භාෂණ පරිවර්තන සේවාව අමතන්න.

**තොරතුරු දැන ගැනීමට හෝ රහසිගතව උපදෙස් ලබා ගැනීමට ඔස්ට්‍රේලියා රතු කුරුස සංගමය අමතන්න.**

ටෙලි. 03 9345 1800
ඊමේල්. national_stpp@redcross.org.au
වෙබ්. redcross.org.au/workrighthub

*This Modern Slavery grant activity received grant funding from the Australian Government.*

SINHALESE



**නූතන වහල් සේවය** යනු බලහත්කාරය, තර්ජනය හෝ රැවටීම උපයෝගී කරගනිමින් පුද්ගලයන් සූරාකෑම හා ඔවුන්ගේ නිදහස පැහැර ගැනීමයි. මේවා ඔස්ට්‍රේලියාව තුළ බරපතල අපරාධ වන අතර එයට බලෙන් වැඩෙහි යෙදවීම, පුද්ගල ජාවාරම, වහල් සේවය, දාසබව හා ණය බැඳුම්කර ආදිය ඇතුළත් වේ.

**බලෙන් සේවයේ යෙදවීම** යනු යමෙකුගේ කැමැත්තෙන් තොරව, දඬුවම් කරන බවට තර්ජනය කරමින් එම පුද්ගලයා සේවයේ යෙදවීමයි. **පුද්ගලයන් ජාවාරම** යනු සූරාකෑමේ අරමුණ ඇතිව වංචාවෙන්, තර්ජනයෙන් හෝ බලෙන් යම් අයෙකු බඳවා ගැනීමයි. කෘෂිකාර්මික, සත්කාර සේවා, ඉදිකිරීම, පිරිසිදු කිරීම හා ලිංගික කර්මාන්ත ආදී ඕනෑම කර්මාන්තයක දී සිදුවිය හැකිය.

**දාස භාවය** යනු, තර්ජන, බලහත්කාරකම හෝ රැවටීම නිසා කිසියම් පුද්ගලයකු තම සේවය නැවත්වීමට හෝ සේවය හැර යාමට නොසිතීමයි. මෙහිදී රැකියාවට බාහිර ක්ෂේත්‍රවල ද ඔවුන්ගේ පුද්ගලික නිදහස සැලකිය යුතු ලෙස පැහැර ගැනීම සිදුවේ. නිවෙස්වල වැඩ කරන සංන්දර්භයන් හි දී, තත්ත්වයන් හා කොන්දේසි වහල් සේවයට සමාන සේ පත් වූ විට. **කුටුම්භ දාස** බව ඇති වේ.

ණයක් ගෙවීම සඳහා කෙනෙකුගේ පෞද්ගලික සේවා ලබා ගැනීම **ණය බැඳුම්කරයක්** නම් වේ.මෙහි දී ගෙවිය යුතු හෝ ගෙවිය යුතු බව කියා ඇති ණය මුදල අතිවිශාල වීම හෝ ණය ගෙවීම සඳහා සේවකයා කරන වැඩ ප්‍රමාණය අසාධාරණ වීම සිදු වේ.

## සූරා කෑමට ලක්වන බවට වන ලක්ෂණ

- බලෙන් වැඩ ගැනීම
- ඉතාම කෙටි විවේකයක් දෙමින් දිගු පැය ගණනක් වැඩ ගැනීම
- නිසියාකාරව වැටුප් නොගෙවීම
- ගමන් වියදම්, නවාතැන්, නිල ඇඳුම්, ප්‍රවාහනය හෝ රැකියා ලියකියවිලි සඳහා බඳවා ගන්නෙකුට හෝ සේවා යෝජකයකුට විශාල ණයක් ගෙවමින් සිටීම
- සේවා ස්ථානයෙන් අස්වී යා නොහැකි වීම හෝ තත්ත්වයන් වෙනස් විසඳා ගත හැකි නොවීම
- සේවා ස්ථානයේ දී පිටුවහල් කරන බව හෝ පවුලේ අයට හානි සිදු කරන බව කියමින් පොලඹවා ගැනීම හෝ තර්ජනය කිරීම සිදුවීම
- ඔබේ ගමන් බලපත හෝ සෙසු අනන්‍යතා ලේඛන ලබා ගත නොහැකි වීම
- වෛද්‍යවරයකු හමුවීමට හෝ වෛද්‍ය ප්‍රතිකාර ගැනීමට නොහැකි වීම

## ඔබ කිසියම් අයෙකුගේ නිවසේ වැඩ කරන්නේ නම්, මේවා ද සූරා කෑමට ලක්වීමේ ලක්ෂණ වේ.

- පෞද්ගලික කරුණු වෙනුවෙන් කිසිසේත් ම නිවසින් පිටත යෑමට නොහැකි වීම හෝ ඉතා කලාතුරකින් පමණක් පිටත යෑමට හැකි වීම
- සේවා යෝජකයාගේ අධීක්ෂණය යටතේ පමණක් නිවසින් පිටතට යෑමට හැකි වීම
- පවුලේ අය හා හිත මිතුරන් සමග සම්බන්ධතා පවත්වා ගැනීමට අවස්ථාව නොදීම
- දුරකථනය භාරයට ගැනීම
- නුදුසුදු ස්ථානවල නිදා ගැනීමට හෝ එවන් ස්ථාන බෙදාහදා ගැනීමට සැලැස්වීම හා පෞද්ගලික අවකාශයක් කිසිසේත්ම ලබා නොදීම
- තර්ජන, පහත් කොට සැලකීම්, හිංසන හෝ ප්‍රචණ්ඩත්වයන් සිදු කිරීම
- නින්ද හා ආහාර ගැනීමේ අයිතිය පැහැර ගැනීම



## උදව් තිබේ

රතු කුරුස සංගමය මගින් උපදේශ හා උපකාර ලබා දෙන අතර උදව් සඳහා ඔබව වෙනත් සේවාවන් වෙත ද යොමු කළ හැකිය. භාෂණ පරිවර්තක සේවා තිබේ.

**03 9345 1800 අමතන්න නැත්නම් national_stpp@redcross.org.au වෙත ඊමේල් යොමුකරන්න.**

පුද්ගලයන්ට පිළිලැබීමට හා සිය ජීවිත නැවත ගොඩනගා ගැනීමට **උපකාර කරන වැඩසහටනක්** වේ. මෙම වැඩසටහන මගින් පුද්ගලයන්ට ජීවත් වීමට ආරක්ෂිත ස්ථානයක් සොයා ගැනීමට, වෛද්‍ය රැකවරණ, උපදේශන, නෛතික සේවා හා සංක්‍රමණ උපදෙස් ලබා ගැනීමට, මූල්‍ය ආධාර, අධ්‍යාපනය හා පුහුණුව හෝ රැකියාවක් සොයා ගැනීමට හා සමාජ සම්බන්ධතා සඳහා උපකාර කරයි. මේ වැඩසටහන ගැන වැඩිදුර විස්තර රතු කුරුස සංගමය වෙතින් ලබා ගත හැකිය.

මෙම කටයුතුවලට සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් ජාවාරම්වලට ලක්වූවන් සම්බන්ධ වැඩසටහන යටතේ අරමුදල් සපයයි.

**විශ්වසනීයව නොමිලේ ලබා දෙන නීති උපදෙස් සඳහා 02 9514 8115 ඔස්සේ හෝ ASALegal@uts.edu.au** ඔස්සේ Anti-Slavery Australia අමතන්න.

හදිසි අවස්ථාවක දී හෝ කිසිවකු ගේ ආරක්ෂාවට තර්ජනයක් ඇත්නම් **000** ඔස්සේ පොලිසිය අමතන්න. නූතන වහල්භාවය විය හැකි අවස්ථාවක් ගැන වාර්තා කිරීමට **131 237** ඔස්සේ ඔස්ට්‍රේලියා ෆෙඩරල් පොලිසිය අමතන්න.

අදාළ සිදුවීමට දරුවකු සම්බන්ධ නම් ළමා ආරක්ෂණ නීති යටතේ අනිවාර්ය වාර්තාකරණය අවශ්‍ය විය හැකිය.